**ශීර්ෂය 105 - ජනමාධ්‍ය අමාත්‍යාංශය**

------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 සැප්තැම්බර් 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය සතුව වාහන 28 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර එම වාහනවල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණ බැවින්, දේපල පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදි නොවුණි. | ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද අංක MED/A/MM/A,B,C,D/2020/05 අංක හා 2021 මැයි 06 දිනැති ලිපිය අනුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කර MMI/7/9/92-2021 හා 2021 මැයි 19 දිනැති ලිපිය මඟින් ඉදිරිපත් කර ඇත. | අමාත්‍යාංශය සතු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට පියවර ගත යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නිවේදනය අනුව ශීර්ෂ 105 යටතේ ජනමාධ්‍ය අමාත්‍යාංශය ආරම්භ විය. 2020 ජනවාරි මාසයේ සිට 2020 අගෝස්තු 31 දින දක්වා එවකට පැවැති ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හා අමාත්‍යාංශ 03 ක වැය විෂයයන් 73 ක් යටතේ වැය කර තිබුණු එකතුව රු.මිලියන 805 ක වියදම මෙම අමාත්‍යාංශයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2020 ඔක්තෝම්බර් 20 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කළ 2020 අංක 6 දරන විසර්ජන පනතේ 10 හා 12 වගන්තිවල සඳහන් විධිවිධානවලට අනුව 2020 ජනවාරි මාසයේ සිට අගෝස්තු 31 දක්වා වියදම් 2020 අංක 6 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ සඳහන් වැය ශීර්ෂ යටතේ වන වැය විෂයයන්වලට අන්තර්ග්‍රහනය කළ යුතුව තිබුණු අතර, ඒ අනුව එම කාර්යභාරය 2020 නොවැම්බර් 30 දිනැති අංක 6/2020 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව සිදු කිරීමට භාණ්ඩාගාරය විසින් ලබාදුන් උපදෙස් පරිදි සිදු කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වියදම් නිවැරදිව වාර්තා කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------- | ------------------------ | ---------- |
| පුනරාවර්තන වැය විෂයයන් 07 ක රු.1,237,496 ක් හා මූලධන වැය විෂයයන් 10 ක රු.115,959,168 ක් වශයෙන් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවති අතර මෙය එම වැය විෂයයන් සඳහා වූ ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය නොකිරීම හෝ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා මත සිදුවූවක් බව නිරීක්ෂණය විය. | රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි කාර්යයන් සිදු කිරීමට නොහැකි වීම මත වැය විෂයයන් හි ප්‍රතිපාදන ඉතිරිවීම් සිදුවිය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------- | ---------------------- | ------------- |
| (අ) | 2021 වර්ෂය තුළ නිරවුල් කළ රු.217,669 ක් වූ බැඳීම් හා බැරකම් 02 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ නිරවුල් කළ රු.217,669 ක් වූ බැඳීම් හා බැරකම් වාර්තා වී නොතිබීම නිසා ඒවා බැරකම් හා බැඳීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොතිබුණද සේවා අවශ්‍යතාවයන් මත ගෙවීම් කිරීමට සිදුවී ඇත. | මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග සියළු බැරකම් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී 105-01-03-1409 වැය විෂයයේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට බැරකමක් ලෙස තිබූ රු.659,610 ක් 2021 පෙබරවාරි 02 දින ගෙවා තිබූ අතර, එය 2021 වර්ෂයේ වැය ලෙජරයේ පෙර වර්ෂයේ ගිණුම්ගත බැඳීම් ලෙස නොදක්වා 2021 වර්ෂයේ ගිණුම්ගත බැඳීම් ලෙස සටහන් කර තිබුණි. | 2020 වර්ෂයේදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට බැරකම් ලෙස දක්වා තිබූ රු.659,610 අතපසු වීමකින් 2021 වැය ලෙජරයේ පෙර වර්ෂයේ ගිණුම්ගත බැඳීම් ලෙස නොදක්වා 2021 වර්ෂයේ ගිණුම්ගත බැඳීම් ලෙස සටහන් කර ඇත. | අමාත්‍යාංශයේ පොත්පත් නිසි පරිදි පවත්වාගත යුතුය. |

## 2.4 ගණන් දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන අතර ඉදිරියේදී එහි සඵලදායිත්වය පිළිබඳව සමාලෝචනයන් සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| 2015 ජූලි 14 දිනැති අංක 3/2015 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ | 676,235 | තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් දින 18 සිට දින 116 ක් දක්වා ප්‍රමාද වී පියවීම් සිදුකර තිබූ අවස්ථා 26 ක් නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලය සීමා සහිතව රාජකාරියට වාර්තා කිරීම නිසා අදාළ අග්‍රිම මුදල් පියවීම ප්‍රමාද වීම් සිදුවී ඇති අතර ඉදිරියේදී එවැනි අතපසු වීම් වැළැක්වීමට කටයුතු කෙරේ. | අග්‍රිම ලබා ගන්නා නිලධාරීන් ප්‍රමාදයකින් තොරව අග්‍රිම පියවිය යුතුය. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ලබාගත් අත්තිකාරම් නිසි පරිදි පියවීමට අපොහොසත් වීම නිසා නිලධාරීන් තුන්දෙනෙකුට අත්තිකාරම් ලබා දීමෙන් වලකින ලෙස ප්‍රධාන ගණකාධිකාරී විසින් දැනුම් දී තිබුණ ද ඊට පටහැනිව රු.258,950 ක අත්තිකාරම්, අවස්ථා 14 කදී ලබාදී තිබුණි. | නිලධාරීන් විසින් ලබාගෙන තිබූ අත්තිකාරම් නැවත පියවන තුරු අත්තිකාරම් ලබා නොදෙන ලෙස ප්‍රධාන ගණකාධිකාරී විසින් අත්තිකාරම් ලේඛනයේ සටහන් කර තිබුණි. නමුත් එම නිලධාරින් විසින් ලබාගත් අත්තිකාරම් මුදල් පියවීමෙන් අනතුරුව අදාළ මාණ්ඩලික නිලධාරියා නමින් අත්තිකාරම් ලබාදී ඇත. | පළමුව ලබාගත් අත්තිකාරම් නිසිපරිදි පියවා ඇත්ද යන්න තහවුරු කරගැනීමෙන් පසුව නැවත අත්තිකාරම් ලබා දීමට පියවර ගත යුතුය. |
| (ආ) | එක් අත්තිකාරමක් ලබාදී එය පියවීමට ප්‍රථම නිලධාරීන් 4 දෙනෙකුට අවස්ථා 20 කදී රු.335,408 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | අමාත්‍යාංශයේ සිදුවන හදිසි කටයුතු වලදී (කමිටු රැස්වීම්, භාණ්ඩ මිලදී ගැනීම්) නිරන්තරයෙන් අත්තිකාරම් ලබාදීමට සිදුවේ. තවද 2020 වසරේ අමාත්‍යාංශයේ සිටි මාණ්ඩලික නිලධාරීන් පිරිස සීමිත | පළමුව ලබාගත් අත්තිකාරම් නිසිපරිදි පියවා ඇත්ද යන්න තහවුරු කරගැනීමෙන් පසුව නැවත අත්තිකාරම් ලබා දීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | වූ බැවින් හා එම මාණ්ඩලික නිලධාරීන් නමින් පමණක් අත්තිකාරම් ලබාදීම සිදුවන නිසා මුලින් ලබාගත් අත්තිකාරම පියවීමට ප්‍රථම තවත් අත්තිකාරම් ලබාදීමට සිදුවන අවස්ථා ඇත. | |

## 2.7 අත්තිකාරම් ගිණුම් ශේෂ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.231,188 ක ශේෂයක් පැවති අතර ඊට අදාළ කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එම හිඟ ණය ශේෂය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් 2021 මාර්තු 31 දින වන විටත් අනුගමනය කර නොතිබුණි. | 2020 ජූලි 23 තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කළ නිලධාරියෙකුගේ අභියාචනය පදනම්ව මූලික විමර්ශනයක් 2021 අප්‍රේල් 29 දින පැවැත්වූ අතර, ඔහුගෙන් රජයට අයවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | හිඟ ශේෂ ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ 02 කට අදාලව වියදම රු.මිලියන 9.235 ක්වූ ක්‍රියාකාරකම් 03 ක කාර්යසාධන ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | රටෙහි පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි කාර්යයන් සිදුකිරීමට නොහැකි විය. | සැළසුම් කරන ලද කාර්යයන් නිසි පරිදි ඉටුකිරීමට කටයුතු කළ යුතුය |

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළ යුතු වුවත් අමාත්‍යාංශය විසින් සිය ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළයුතු වුවද අමාත්‍යාංශය විසින් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළ යුතු වුවද 2020 වර්ෂයේ පැවති අතුරු සම්මත ගිණුම් මඟින් ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන්වීමක් සිදු නොවූ බැවින් විස්තරාත්මක ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කිරීමට නොහැකි වූ අතර, ඉදිරියේදී විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ භාවිතයේ තිබූ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත් PD-9625 දරන කැබ්රථය 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්වී තිබුණු අතර අනතුර සිදුවන අවස්ථාව | අදාළ නිලධාරියා විසින් වාහන පැදවීම අමාත්‍යාංශයේ අනු දැනුමකින් තොරව සිදුව ඇත. මෙම පරීක්ෂණයෙන් නිලධාරියා වගකිව යුතු බවත් ඔහුගෙන් අදාළ | රාජ්‍ය දේපලවල සුරක්ෂිතභාවය ආරක්ෂා වන පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වන විට වාහනයට අනුයුක්තව සිටි රියදුරු වෙනුවට එවකට සිටි අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා රියදුරු ලෙස කටයුතු කර තිබුණ ද, වාහනයක් පැදවීම සඳහා අවශ්‍ය රියදුරු බලපත්‍රයක් ඔහු සතුව නොතිබුණු බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් 2019 ජූනි 27 දින ලබාදුන් ලිපිය අනුව නිරීක්ෂණය වූ අතර, මු.රෙ. 104 (1) පරිදි පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය කිරීමටත් ඊට වගකිවයුත්තන් නිශ්චය කිරීමටත් පරීක්ෂණ ආරම්භ කළයුතු වුවත් අමාත්‍යාංශය විසින් අනතුර සිදුවී වසර 1 1/2 කට පමණ පසුව පරීක්ෂණය පැවැත්වීම සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කර තිබුණු අතර එම මූලික පරීක්ෂණය සිදුකර වාර්තාව ලබාදීමට වසර දෙකකට වැඩි කාලයක් ගතවී තිබුණි. | මුදල් අයකර ගැනීමටත් නීතිමය කටයුතු සිදුවෙමින් පවතින අතර මු.රෙ.104 පරීක්ෂණ කටයුතු වල ඉදිරියේදී ප්‍රමාදයක් සිදු නොවීමට කටයුතු යොදා ඇත. | |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාව 158 ක් වී තිබුණු අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 105 ක් වීම නිසා පුරප්පාඩු 53 ක් පැවැතුණි. එම පුරප්පාඩු පිරවීම සඳහා වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටම්වල නිලධාරීන්ගේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා අදාළ පත්වීම් බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. ප්‍රාථමික මට්ටම්වලට අදාළව (PL තනතුරු) අමාත්‍යාංශ මට්ටමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී. | සේවක පුරප්පාඩු නිසි පරිදි සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |